කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

ආර්ථිකවිද්‍යාව

සාර්ව ආර්ථිකවිද්‍යාව ECON – E3015

කැමති ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. අ) සමතුලිත ජාතික ආදායම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 05)

ආ) විවෘත ආර්ථිකයක සමතුලිත ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය සමඟ සම්බන්ධ වන සංරචක රූපසටහනක් ඇසුරින් පහදන්න. (ලකුණු 10)

ඉ) තුලන අයවැය ගුණකය යනු කුමක්ද? (ලකුණු 05)

02. සම්භාව්‍ය සේවා නියුක්ති න්‍යාය සහ කේන්සියානු සේවා නියුක්ති න්‍යාය සංසන්දනය කර, එකී න්‍යායන්හි ප්‍රායෝගිකත්වය පිළිබඳ ඔබගේ නිගමන මොනවාදැ යි විග්‍රහ කරන්න. (ලකුණු 20)

03. අ) මුදලට ඇති ඉල්ලුම පිළිබඳ විග්‍රහ කිරීමේදී කේන්සියානුවන් සහ මූල්‍යවාදීන් අතර පවත්නා මූලික වෙනස්කම් මොනවාද යන්න පහදන්න. (ලකුණු 10)

ආ) අර්ථ ක්‍රමයක මුදලට ඇති ඉල්ලුම පිළිබඳ නව මූල්‍යවාදී විග්‍රහයේ ගතිකත්වය ඔබ පිළිගන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 10)

04. අ) කේන්සියානු විග්‍රහය තුළ ආර්ථිකයක පරිභෝජනය සහ ඉතුරුම් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා එකී ආකෘතියේ දක්වා ඇති 'මනෝ මූල නියාමය' (Psychological law) කුමක්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08)

ආ) පශ්චාද් කේන්සියානු පරිභෝජන කල්පිත මොනවාද යන්න පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

05. 'ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන ආර්ථික අර්බුදය නිදහසින් පසුව අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්ති සහ රට මුහුණ දුන් සිවිල් යුද්ධ තුළින් ඇති කෙරෙන ලද්දකි.' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? හේතු පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. අ) අන්තර්ජාතික වෙළෙඳාමට හේතු සහ වෙළෙඳාමේ වාසි ''සාපේක්ෂ පිරිවැය වාසි න්‍යාය'' පෙන්වා දී ඇත්තේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 12)

ආ) ජාත්‍යන්තර වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාවේ අත්දැකීම් සම්බන්ධයෙන් විමර්ශනය කරන්න. (ලකුණු 08)

07. අ) 'IS-LM' විග්‍රහය අර්ථක්‍රමයක සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සැකසීමේදී භාවිත කළ හැකි න්‍යායාත්මක උපකරණ රාශියකින් සැදුම්ලත් ආර්ථික ප්‍රපංචයකි.' පහදන්න.

(ලකුණු 10)

ආ) අර්ථ ක්‍රමයක සාර්ව ආර්ථික සමතුලිතය සඳහා රාජ්‍ය මූල්‍ය සහ මූල්‍ය ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාව නිදසුන් ඇසුරින් පරීක්ෂා කරන්න. (ලකුණු 10)

08. අ) ශ්‍රී ලංකාව නිදහසින් පසුව අඛණ්ඩව හිඟ අයවැය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ ප්‍රතිවිපාක මොනවාද යන්න පහදා, හිඟ අයවැය ප්‍රතිපත්තියෙන් මිදීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා මොනවාද සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) විදේශ ණය සහ විදේශාධාර මොනවාද යන්න පහදා ආර්ථික සංවර්ධනයේ දී ඒවායේ කාර්යභාරය හා ප්‍රතිවිපාක ප්‍රායෝගික නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

09. ගෝලීය ආර්ථික කම්පන සහ මෑතකාලීන දේශීය ආර්ථික අර්බුදය අතර සහ-සම්බන්ධයක් පවතින බවට ඉදිරිපත් කර ඇති මතයට පක්ෂ හා විපක්ෂ තර්ක මොනවාද යන්න පිළිබඳ ගෝලීය ආර්ථික සංදර්භය තුළ විමර්ශනයක් කරන්න.

(ලකුණු 20)

****************************